Department of Education,Sabaragamuwa Province/ Weekly School




නිපුණතා මට්ටම 6:3 :- විවිධ ප්‍රවේශ ඔස්සේ සර්ව ආර්ථික සමතුලිතය විශ්ලේෂණය කරයි.

සමාහාර ආදායම = සමාහාර වියදම් ප්‍රවේශය

මෙම ප්‍රවේශයට අනුව සැලසුම් කල සමස්ත වියදම මූර්ත නිමවුමේ වටිනාකමට සමාන වන විට සමතුලිත ජාතික මට්ටම තීරණය වේ.

❖ පහත රූප සටහන අනුව සමස්ත වියදම් වක්‍රය $45^0$ රේඛාව සමඟ ඡේදනය වන සමතුලිත, ලක්ෂයේදී (D), සමතුලිත ජාතික ආදායම් මට්ටම තීරණය වේ.(Y1) වේ.




❖ ආර්ථිකයක සමස්ථ වියදම (E)කුටුම්බ පරිභෝජනය(C),ආයෝජන වියදම (I) රාජ්‍ය මිලදී ගැනීම් (G)සහ ශුද්ධ අපනයන වලින් $(\chi - M)$ සමන්විතය.

E= C+I+G+$(\chi - m)$

සමහර ආදායම = සමහර වියදම් ප්‍රවේශය හරහා සර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය සංඛ්‍යා වගුවක් මඟින් ද ඉදිරිපත් කල හැක.

| ආදායම (Y) | වැය කළ හැකි ආදායම yd | පරිභෝජනය C | ආයෝජනය I | රාජ්‍ය වියදම G | අපනයනය (x) | ආනයනය (m) | ශුද්ධ (x-m) ආනයනය | සමස්ථ වියදම E |
|---|---|---|---|---|---|---|---|---|
| 0 | -250 | 400 | 200 | 300 | 200 | 300 | -100 | 800 |
| 4000 | 3750 | 3600 | 200 | 300 | 200 | 300 | -100 | 4000 |
| 8000 | 7750 | 6800 | 200 | 300 | 200 | 300 | -100 | 7200 |

ඉහත වගු සටහන අනුව රු.මි. 4000 ආදායම් මට්ටමේදී සමස්ථ වියදමේ වටිනාකම සමස්ථ ආදායමට සමාන වන නිසා සර්ව ආර්ථික සමතුලිතය රු.මි. 4000 ආදායම් මට්ටමේදී සිදුවේ.

01. කල්පිත ආර්ථිකයට අදාල සර්ව ආර්ථික දත්ත කීපයක් පහත වේ. (රු.බිලියන)

| | |
|---|---|
| ස්වායත්ත පරිභෝජනය | = 200 |
| සැලසුම් කල ආයෝජන | = 100 |
| ආණ්ඩුවේ මිලදී ගැනීම් | = 50 |
| ස්වාධීන බදු | = 100 |
| ආන්තික පරිභෝජන නැම්යාව | = 0.75yd |

I. මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම ගණනය කරන්න.

(yd= y-t) ලෙස සලකන්න.

02. සරල ආර්ථිකයක සර්ව ආර්ථික සමතුලිතය රූප සටහනක් ඇඳ පැහැදිලි කරන්න.